# 5 ශ්‍රේණිය

## පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

## තේමාව 02 - අපි ලක් වැසියෝ













# අපේ ජාතික කොඩිය

පුංචි දූවේ පුතේ,


ශ්‍රී ලංකාවේ ප්‍රථම අගමැතිවරයා වන ඩී.එස්. සේනානායක මහතා 1948 මාර්තු 02 වන දින, ජාතික කොඩිය නිර්මාණය සඳහා කමිටුවක් පත් කළේය. එම කමිටුවේ තීරණයක් මත වර්තමාන ජාතික කොඩිය නිර්මාණය කරන ලදී. ශ්‍රී ලංකාවේ වෙසෙන විවිධ ජාතීන් හා ඔවුන් අතර පවතින එකමුතුකම පෙන්වීම සඳහා යොදා ඇති සෑම සංකේතයක් ම ගැඹුරු අර්ථයක් ගෙන හැර දක්වමින් නිර්මාණය කර ඇති ජාතික කොඩිය ශ්‍රී ලාංකිකයන්ගේ අනන්‍යතාව පිළිබිඹු කරන ජාතික සංකේතයයි.



# ජාතික කොඩියේ ඇති සංකේත හා වර්ණවල තොරතුරු දැන් අපි ඉගෙන ගනිමු

- රතු පැහැති පසුබිම
- කහ පැහැති සිංහ රූපය
- තැඹිලි පාට, කොළ පාට තීරු
- මුළු කොඩිය වට කර යොදූ කහ පාට තීරුව
- කොඩිය ඇතුළත බෝ කොළ සතර

- ජාතික අභිමානය
- සිංහල ජාතිය නියෝජනය කිරීම
- දමිළ, මුස්ලිම් ඇතුළු අනෙකුත් ජාතීන් නියෝජනය කිරීම
- කොඩියේ හිමාව මෙන්ම ජාතීන් අතර එකමුතු බව
- මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන සතර බ්‍රහ්ම විහාරණ



## ජාතික කොඩියේ නිරූපිත සංකේත

රතු පාටයි පසුබිම
අප ජාතික අභිමානය බල
සිංහය ජාතිය සිංහල
පෙර කළ විරුවන් බිහි කළ

තීරු දෙකකි කොඩියේ මුල
තැඹිලි පාට සහ තද කොළ
දමිළ ද මුස්ලිම් ඇතුළුව
අනෙකුත් ජාතින් සිහි කළ

සතර බ්‍රහ්ම විහරණ වෙයි
එහි ඇති හතරෙන් බෝ කොළ
මෙත්තා කරුණා මුදිතා
උපේක්ෂාව ඉන් හෙළි කළ

කොඩිය වටේ ඇති තීරුව
දුටුවද කහ පාටින් කළ
එකමුතු කම හා නිමාව
දක්වයි කොඩියේ සුළ මුළ

# ජාතික කොඩිය ඔසවන අවස්ථා





- නිදහස් උත්සවයේ දී
- පාසලේ උදෑසන රැස්වීමේ දී
- රාජ්‍ය තාන්ත්‍රික උත්සව අවස්ථාවල
- දෙස් විදෙස් රාජ්‍ය නායකයන් පිළිගැනීමේ දී
- පාසලේ නිවාසාන්තර ක්‍රීඩා උත්සවයේ දී

# ජාතික කොඩිය අඩ කුඹු කරන අවස්ථා

- ජාතික විපතක දී
- ජාතික ශෝක දිනවල දී
- රාජ්‍ය නායකයෙක් මිය ගිය විට



# ජාතික කොඩිය වැරදි ලෙස භාවිත වන අවස්ථා

- ඉරුණු ජාතික කොඩි එසවීම
- ක්‍රීඩා තරගවල දී කරේ දමා ගෙන නැටීම
- මංගල අවස්ථාවල දී සිරස් අතට එල්ලෙන්නට දැමීම
- ජාතික කොඩිය ශරීරයේ චිත්‍රණය කිරීම



# ජාතික කොඩිය එසවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා
නමෝ නමෝ නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරි බරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා

අපහට සැප සිරි සෙත සදනා
ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා
නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා
ඔබමය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති
අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ
අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ
අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ
නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමී කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර දා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා
නමෝ නමෝ නමෝ නමෝ මාතා



ආනන්ද සමරකෝන් මහතා

- ජාතික කොඩිය ඔසවන අවස්ථාවේ එහි සිටින සියලු දෙනා සිරුවෙන් සිටීම
- වෙනත් ජාතික කොඩි සමග ජාතික කොඩිය ඔසවන විට කොඩිවලට ඉහළින් හෝ සමානව සිටින සේ ජාතික කොඩිය එසවීම
- ජාතික කොඩිය සිරස් අතට සිටින සේ පමණක් එසවීම
- ජාතික කොඩිය ඔසවන අවස්ථාවේ දී ජාතික ගීය අභිමානයෙන් යුතුව ගායනා කිරීම
- ජාතික ගීය ගායනය හෝ අනුවාදනය අවසන් වූ පසු හිස නමා ජාතික කොඩියට ආචාර කිරීම

## ජාතික ගීය ගායනා කරන විට සිටිය යුතු ආකාරය

- විළුඹ දෙක ළං වන සේ තබා ගෙන සතුල් දෙකේ ඇඟිලි කොටස " V " අකුරේ හැඩයට තබා ගත යුතු ය
- දෙපා හා දෑත් සිරුවෙන් සිටීමේ නිවැරදි ආකාරයට තිබිය යුතු ය
- උරහිස් හා කඳ සෘජුව තබා ගත යුතු ය
- හිස කෙළින් තබා ගෙන ඉදිරිය දෙස ඇස් ඇරගෙන බලා සිටිය යුතු ය



## දැන් අපි රාජ්‍ය ලාංඡනය ගැන පුංචි තොරතුරු ටිකක් සොයා බලමු

රාජ්‍ය අධිකිය හඳුන්වන
සංකේතය වන්නේ රාජ්‍ය
ලාංඡනයයි. අද භාවිත
වන රාජ්‍ය ලාංඡනය
වර්ෂ 1972 දී භාවිතයට
ගත් රාජ්‍ය ලාංඡනයයි

අපේ රාජ්‍ය ලාංඡනය
නිර්මාණය එස්. එම්.
සෙනෙවිරත්න මහතා විසින්
සිදු කළා. මේ තියෙන්නෙ
එතුමාගේ රූපයක්

රාජ්‍ය ලාංඡනයේ පොදු අදහස
වන්නේ " ස්වයංපෝෂිත රටක
ඉර, හඳ පවතින තෙක් ධර්මය
ආරක්ෂා කරමින් මුළු මහත්
ජනතාව වැජඹේවා ! "










## දැන් අපි රාජ්‍ය ලාංඡනයේ සංකේත හා ඒවායේ තේරුම් ඉගෙන ගමු

- පුන්කලසින් - සෞභාග්‍යය හා පරිපූර්ණ බව
- වී කරලින් - ස්වයංපෝෂිත බව හා සශ්‍රීකත්වය
- කඩුවක් අතින් ගත් පලා පෙති වටය මැද සිටින සිංහයාගෙන් - රට හා විනයගරුක ජනයා
- ධර්ම චක්‍රයෙන් - ධර්මය
- ඉර හඳ දෙකෙන් - සදාතනික පැවැත්ම ද කීර්තිමත් වන බව

## රාජ්‍ය ලාංඡනය දැකිය හැකි ස්ථාන

- පාසල් පෙළ පොත්වල
- කාසිවල
- ජාතික හැඳුනුම්පතේ
- රාජ්‍ය ආයතනවල
- රජයේ ලියකියවිලිවල
- රජයට අයත් වාහනවල



ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා - වලිකුකුළා

ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය - නා ගස





ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය - මානෙල් මල



ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව - වොලිබෝල්



ශ්‍රී ලංකාවේ ජාතික සත්ත්වයා - දඬු ලේනා



ශ්‍රී ලංකාවේ ජාතික මැණික - නිල් මැණික

# ශ්‍රී ලංකාවේ පළාත් පුෂ්ප


01. උතුරු මැද පළාත - ඇසෑල/ඇසළ



02. දකුණු පළාත - හින්බෝවිටියා



03. වයඹ පළාත - ඇට්ටේරියා



04. ඌව පළාත - ගුරුළු රාජ



05. මධ්‍යම පළාත - මහ රත් මල්



06. සබරගමුව පළාත - වෙසක් මල්



07. බස්නාහිර පළාත - සුදු නෙළුම්



08. නැගෙනහිර පළාත - ගොඩ මානෙල්



09. උතුරු පළාත - පුෂ්ප වර්ග දෙකක් යෝජනා ඉදිරිපත් වී ඇත

- වල් පිච්ච
- විෂ්ණුක්‍රාන්ති



# දකුණු පළාත් පුෂ්පය

## හීන් බොවිටියා



## පළාත පිහිටවූ වර්ෂය - 1833

පළාතට අයත් දිස්ත්‍රික්ක

↓

ගාල්ල, මාතර, හම්බන්තොට

# බස්නාහිර පළාත් පුෂ්පය

## සුදු නෙළුම්



## පළාත පිහිටවූ වර්ෂය - 1833

පළාතට අයත් දිස්ත්‍රික්ක

↓

කොළඹ, ගම්පහ, කළුතර

# සබරගමුව පළාත් පුෂ්පය

## වෙසක් මල



## පළාත පිහිටවූ වර්ෂය - 1889

පළාතට අයත් දිස්ත්‍රික්ක

↓

රත්නපුර, කෑගල්ල

# ඌව පළාත් පුෂ්පය

## ගුරුළුරාජ



## පළාත පිහිටවූ වර්ෂය - 1886

පළාතට අයත් දිස්ත්‍රික්ක

↓

බදුල්ල, මොනරාගල

# උතුරුමැද පළාත් පුෂ්පය

## ඇහැල මල



## පළාත පිහිටවු වර්ෂය - 1873

පළාතට අයත් දිස්ත්‍රික්ක

↓

අනුරාධපුරය, පොළොන්නරුව

# වයඹ පළාත් පුෂ්පය

## ඇට්ටේරිය මල



## පළාත පිහිටවූ වර්ෂය - 1848

පළාතට අයත් දිස්ත්‍රික්ක

↓

කුරුණෑගල, පුත්තලම

# උතුරු පළාත් පුෂ්පය

## වල් පිච්ච



## පළාත පිහිටවූ වර්ෂය - 1833

### පළාතට අයත් දිස්ත්‍රික්ක

↓

යාපනය, මන්නාරම, මුලතිව්,
වව්නියාව, කිලිනොච්චිය

# නැගෙනහිර පළාත් පුෂ්පය

## ගොඩ මානෙල්



## පළාත පිහිටවූ වර්ෂය - 1833

පළාතට අයත් දිස්ත්‍රික්ක

↓

ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර



# මධ්‍යම පළාත් පුෂ්පය

## මහ රත්මල



## පළාත පිහිටවු වර්ෂය - 1833

### පළාතට අයත් දිස්ත්‍රික්ක

↓

මහනුවර, මාතලේ, නුවරඑළිය

# ශ්‍රී ලංකාවේ පළාත් සහ දිස්ත්‍රික්ක



| | |
|---|---|
| 1. කොළඹ<br>කළුතර<br>ගම්පහ | බස්නාහිර පළාත |
| 2. යාපනය<br>කිලිනොච්චිය<br>මන්නාරම<br>මුලතිව්<br>වව්නියාව | උතුරු පළාත |
| 3. ගාල්ල<br>මාතර<br>හම්බන්තොට | දකුණු පළාත |
| 4. මඩකලපුව<br>අම්පාර<br>ත්‍රිකුණාමලය | නැගෙනහිර පළාත |
| 5. මහනුවර<br>මාතලේ<br>නුවරඑළිය | මධ්‍යම පළාත |

6.අනුරාධපුරය
පොළොන්නරුව
} උතුරු මැද පළාත

7. බදුල්ල
මොනරාගල
} ඌව පළාත

8.කුරුණෑගල
පුත්තලම
} වයඹ පළාත

9. රත්නපුරය
කෑගල්ල
} සබරගමුව පළාත

දිස්ත්‍රික්ක = 25
පළාත් = 9

- විශාලතම පළාත = උතුරු මැද පළාත
- වැඩිම දිස්ත්‍රික්ක ගණනක් ඇති පළාත = උතුරු පළාත
- වැඩිම ජනගහනයක් සිටින පළාත = බස්නාහිර පළාත
- වැඩිම ජනගහනයක් සිටින දිස්ත්‍රික්කය = කොළඹ දිස්ත්‍රික්කය
- කුඩාම දිස්ත්‍රික්කය = කොළඹ දිස්ත්‍රික්කය

# විවිධ ජාතීන් හා ආගම් අතර අනන්‍යතාව පිළිබිඹු කරන ලක්ෂණ දැකිය හැකි අවස්ථා



- මහනුවර දළදා පෙරහැර
- මිහිඳු පෙරහැර
- කතරගම පෙරහැර
- කැරොල් ගීත සන්දර්ශන
- මීලාද් උත්සවය ( නබිනායකතුමාගේ උපන් දිනය සැමරීම )
- කතෝලික බැතිමතුන්ගේ දේවස්ථාන මංගල්‍යය
- දොඩම් පෙරහැර ( වැදි ජනතාව විසින් ඉදිරිපත් කරන පෙරහැරකි )







## වසරේ වැදගත් ආගමික උත්සව ( වසරේ දින දර්ශනයේ මාසවල අනුපිළිවෙලින් )

| උත්සවය | ආගම | මාසය |
|---|---|---|
| තෛපොංගල් | හින්දු | ජනවාරි |
| මහා ශිව රාත්‍රී | හින්දු | මාර්තු |
| අලුත් අවුරුද්ද | බෞද්ධ/ හින්දු | අප්‍රේල් |
| මහ සිකුරාදා | කතෝලික | අප්‍රේල් |
| වෙසක් පොහොය | බෞද්ධ | මැයි |
| රාමසාන් | ඉස්ලාම් | ජූනි |
| පොසොන් පොහොය | බෞද්ධ | ජූනි |
| ඇසළ පොහොය | බෞද්ධ | ජූලි |
| හජ්ජි | ඉස්ලාම් | අගෝස්තු |
| දීපවලී | හින්දු | ඔක්තෝම්බර් |
| මිලාදුන් නබිනායක උත්සවය | ඉස්ලාම් | නොවැම්බර් |
| නත්තල් | කතෝලික | දෙසැම්බර් |

## වසරේ වැදගත් ජාතික උත්සව

| උත්සවය | මාසය හා දිනය |
| --- | --- |
| ජාතික දිනය | පෙබරවාරි 04 |
| මැයි දිනය ( ලෝක කම්කරු දිනය ) | මැයි 01 |
| ජාතික වීර දිනය | මැයි 22 |





## ආගමික/ ජාතික වශයෙන් සහයෝගීතාව පෙන්වන අවස්ථා

- සියලුම බැතිමතුන් සිරිපා කරුණා කිරීම
- කතරගම වන්දනා කිරීම
- සිල් සමාදන් වූ අයට දානය පිරිනැමීම
- අවුරුදු කැවිලි පෙවිලි අන්‍යාගමිකයන් හා අන්‍ය ජාතිකයන් සමග බෙදාහදා ගැනීම

# විවිධ ආගම්වල ආගමික නායකයින් හා ආගමික සංකේත


ධර්ම චක්‍රය



බෞද්ධ ආගම

ගෞතම බුදුන් වහන්සේ

කුරුසය



ක්‍රිස්තියානි ආගම

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ

ත්‍රිශූලය



හින්දු ආගම

ශිව දෙවියන්

අඩ සඳ හා තරුව



ඉස්ලාම් ආගම

අල්ලාහ් දෙවියන්

## ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජන කොටස් හඳුනා ගනිමු

- සිංහල

සිංහල පිරිමි අයගේ ඇඳුම ජාතික ඇඳුමයි. එය ආර්ය සිංහල ඇඳුම ලෙසත් හඳුන්වනු ලබයි. සිංහල ගැහැනු අය ඔසරියත්, බොරිච්චි අත් ගෙදු හැට්ටයකුත් අඳිනු ලබයි.

- දෙමළ

දෙමළ පිරිමි අය වේට්ටිය හා බැනියම අඳිති. මීට අමතරව නළලේ අළුවලින් ඉරි සටහන් කර ගෙන සිටිති. දෙමළ ජාතික කාන්තාවෝ ඉන්දියානු සාරිය හා හැට්ටය අඳිති. මීට අමතරව නළලේ තිලකය තබති. හිසෙහි මල් ගැවසීම ද ඔවුන්ටම ආවේණික වූ ලක්ෂණයයි.

- මුස්ලිම්

මුස්ලිම් පිරිමි අය ජුබ්බා නම් ඇඳුම සමග තොප්පිය පළඳිති. මුස්ලිම් ජාතික කාන්තාවෝ හබායා නම් ඇඳුම අඳින අතර, හිසට ඕජාහාප් නම් පලඳනාව ද පලඳිති. පාසල් යන ගැහැනු ළමයි පර්දා නමැති ඇඳුම අඳිති.

- බර්ගර්

බර්ගර් පිරිමි අය යුරෝපීය ඇඳුම අඳිති. එයට කලිසම, කමිසය, කබාය හා කරපටිය ඇතුළත් ය. බර්ගර් ජාතික කාන්තාවෝ යුරෝපීය කාන්තාවන්ගේ ඇඳුම වන ගවුම අඳිති.

## විවිධ ජාතීන්ගේ ආචාර විධි

01. සිංහල - දෑත් එක් කොට ' ආයුබෝවන් ' යැයි කීම

02. දෙමළ - දෑත් එක් කොට ' වණක්කම් ' යැයි කීම

03. මුස්ලිම් - ' අස්සලාමු අලෛකුම් ' යැයි කීම

## විවිධ ජාතීන් අදහන ආගම්

01. සිංහල - බෞද්ධ ආගම/ ක්‍රිස්තියානි ආගම

02. දෙමළ - හින්දු ආගම/ ක්‍රිස්තියානි ආගම

03. මුස්ලිම් - ඉස්ලාම් ආගම

සියලුම ජාතීන් පොදුවේ සමරන උත්සව ජාතික උත්සව ලෙස හඳුන්වනු ලබනවා, සිංහල - හින්දු අලුත් අවුරුදු උත්සවය ඒ දෙපාර්ශවයට ම පොදු වූ උත්සවයක්

## විවිධ ආගමිකයන්ගේ ආගමික උත්සව

| ආගම | ආගමික උත්සව |
| --- | --- |
| බෞද්ධ | වෙසක්, පොසොන්, ඇසළ, කඨින පිංකම්, උපසම්පදා උත්සව, කුල දරුවන් පැවිදි කිරීමේ උත්සව |
| ක්‍රිස්තියානි | නත්තල්, අළු බදාදා, පාස්කු, මහ සිකුරාදා, පල්ලියේ මංගල්‍යයන් |
| හින්දු | දීපවාලි, තෛපොංගල්, තේරු උත්සව, වේල් උත්සව, මහා ශිව රාත්‍රී උත්සවය |
| ඉස්ලාම් | හජ්ජි උත්සවය, මිලාදුන් නබිනායකතුමාගේ උත්සවය, රාමසාන් උත්සවය |

# විවිධ ආගම් අදහන අයගේ පූජනීය ස්ථාන

බෞද්ධ



පන්සල

ක්‍රිස්තියානි



පල්ලිය / දේවස්ථානය

හින්දු



කෝවිල

ඉස්ලාම්



මස්ජිදය

# විවිධ ආගම්වලට අයත් පූජකවරු

බෞද්ධ




ස්වාමීන් වහන්සේ

ක්‍රිස්තියානි



පූජකතුමා

හින්දු



හින්දු පූජකතුමා

ඉස්ලාම්



ඉස්ලාම් පූජකතුමා





# විවිධ ජාතීන්ගේ ආහාර වර්ග





| ජාතිය | ආහාර වර්ග |
|---|---|
| සිංහල | කිරිබත්, කොණ්ඩ කැවුම්, මුං ගුලි, මුං කැවුම් |
| දෙමළ | තෝසය, සාම්බාරු හොදි, වඩේ, ඉටිලි, ලඩ්ඩු, මුරුක්කු |
| මුස්ලිම් | බුරියානි, පරාටා, වටලප්පන්, බුන්දි |
| බර්ගර් | ලම්ප්‍රයිස්, කේක්, රෝල්ස්, පැටිස්, කට්ලට් |

## පුංචි දුවේ පුතේ,

## අපි දැන් අපේ රටට විශිෂ්ඨ සේවයක් කළ පුද්ගලයන් ගැන ඉගෙන ගනිමු



ක්‍රි. ව 1815 දී බ්‍රිතාන්‍යයන්ට යටත්විජිතයක් වූ අපේ මව්බිම නැවත මුදවා ගැනීමට දායකත්වය දැක්වූ විශාල පිරිසක් සිටියා. ඔවුන්ට අපි සදා ගෞරව කළ යුතුයි. ඒ වගේ ම එදා මෙදාතුර රටට විශිෂ්ඨ සේවයක් කළ විශාල පිරිසකුත් ඒ අතර ඉන්නවා

# ශ්‍රී ලංකාවේ ආදිවාසීන්

මුල්කාලීනව සිට ඒ ආකාරයෙන් ම තමන්ගේ අනන්‍යතාව රැක ගනිමින් ජීවත්වන ජන වර්ගයක් ලෙස අපට අපේ ආදිවාසීන් හෙවත් වැද්දන් හැඳින්විය හැකිය.



## ආදිවාසීන් අතීතයේ විසූවා යැයි සැලකෙන ප්‍රදේශ

- සබරගමුව
- පදවි ගම්පොළ
- වැද්දාගල

## වර්තමානයේ වැදි ගම්මාන දැකිය හැකි ප්‍රදේශ

- දඹාන
- මහඔය
- හෙන්නානිගල
- පොරබොරවැව
- මහියංගණය
- දිඹුලාගල

## වැදි භාෂාව

- ගම් පොජ්ජ් - ගම
- අප්පිලැත්තො - තාත්තා
- අම්මිලැත්තො - අම්මා
- බොට සඳා - අලියා
- සැටා - කොල්ලා
- සැටි - කෙල්ල
- හුරා - මහත්තයා

## අපට සේවා සපයන ආයතන

- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- ලංකා විදුලිබල මණ්ඩලය
- රාජ්‍ය බැංකු
- නගර සභාව
- රෝහල
- ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය

## අපට සේවා සපයන පෞද්ගලික ආයතන

- පෞද්ගලික බැංකු
- සුපිරි වෙළඳ සැල්
- වෙළඳ සැල්
- පෞද්ගලික මූල්‍ය ආයතන
- වාහන සේවා ආයතන
- පෞද්ගලික දුරකථන සේවා සපයන ආයතන


## අපට සේවා සපයන ආයතනවල කාර්යයන්

| ආයතන | කාර්යයන් |
|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | උප්පැන්න හා මරණ සහතික නිකුත් කිරීම |
| රජයේ රෝහල, පෞද්ගලික රෝහල | රෝගීන් සුවපත් කිරීම |
| රාජ්‍ය බැංකු, පෞද්ගලික මූල්‍ය ආයතන | මුදල් ගනුදෙනු කිරීම |
| වෙළඳ සැල්, සුපිරි වෙළඳ සැල් | මිනිසුන්ට අවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීම |
| ලංකා විදුලිබල මණ්ඩලය | විදුලිය සැපයීම ආශ්‍රිත කටයුතු |
| ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | ජලය සම්පාදනය ආශ්‍රිත කටයුතු |



# රටට විශිෂ්ඨ සේවයක් කළ පුද්ගලයින්

අනගාරික ධර්මපාලතුමා




ආනන්ද සමරකෝන්




කුමාරතුංග මුනිදාස



එස්. මහින්ද හිමි



සී. ඩබ්. ඩබ්. කන්නන්ගර



හෙන්රි ස්ටීල් ඕල්කට්




හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි



මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි




වීරපුරන් අප්පු



පොන්නම්බලම් අරුණාචලම්



මාර්ටින් වික්‍රමසිංහ



මොනරවිල කැප්පෙටිපොළ



ආනන්ද කුමාරස්වාමි



ආතර් සී. ක්ලාක්



ඩී. එස්. සේනානායක



ආචාර්ය ටී. බී ජයා



# අපේ රටට විශිෂ්ට සේවයක් කළ පුද්ගලයින්



# එස්. මහින්ද හිමි



★ හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි



# මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි



# ⭐වීර කැප්පෙට්පොළ තුමා






## වීර පුරන් අප්පු



⭐ වීර ගොංගාලේගොඩ බණ්ඩා
( පැලියගොඩ ඩේවිඩ් , අලුදෙණියේ
බණ්ඩා , ශ්‍රී වික්‍රම සර්ව සිද්ධි)



# හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා




# ආනන්ද කුමාරස්වාමි





# අනගාරික ධර්මපාල තුමා



# වලිසිංහ හරිස්චන්ද්‍ර තුමා



# පොන්නම්බලම් අරුනාචලම්



# පොන්නම්බලම් රාමනාදන්



## ඩී. එස්. සේනානායක මහතා

# සර් ඩී. බී. ජයතිලක මහතා



## ⭐ සී. ඩබ්ලිව් . ඩබ්ලිව් කන්නන්ගර මහතා



# ජ්. ඩබ්ලිව් . පෙරේරා මහතා



# ★ සිද්ධි ලෙබ්බේ මහතා



# මාර්ටින් වික්‍රමසිංහ මහතා





# ජාතික අභිමානය දනවන කවි/ගීත

01. "පෙරදිග මුතු ඇටයයි මේ - ලෝකේ සිරිබර සිරි ලංකා"

( ලතා වල්පොල/ධර්මදාස වල්පොල )

02. "රත්න දීප ජන්ම භූමි - ලංකා දීප විජය භූමි"

( පණ්ඩිත් ඩබ්. ඩී. අමරදේව )

03. "ලංකා ලංකා පෙම්බර ලංකා - පිනවමු ඔබ ලංකා"

( සුනිල් ශාන්ත )

04. "මේ සිංහල අපගෙ රටයි - අප ඉපදෙන මැරෙන රටයි"

( නන්දා මාලනී )

05. "හෙළ ජාතික අභිමානේ"

( සී. ටී. ප්‍රනාන්දු )

06. "මගේ රට " කවි පන්තිය

( පී. බී. අල්විස් පෙරේරා )